# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2015

## Primary Piriven Year End Term Test - 2015

1 වසර / Grade 1

ගණිතය
Mathematics

කාලය : පැය දෙකයි
Time : Two hours

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

## I කොටස

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.** ( ලකුණු $2 \times 20 = 40$ යි )

**1.** 5483 යන සංඛ්‍යාවෙහි 4 ඉලක්කමෙහි වටිනාකම කොපමණ ද?

**2.** 500 025 සංඛ්‍යාව කියවන ආකාරය වචනයෙන් ලියන්න.


**3.** $400 + \ldots\ldots + 3 = 453$ මෙහි හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?

**4.** පාට පැන්සල් පෙට්ටියක මිල රු. 65 කි. එවැනි පෙට්ටි තුනක මිල සොයන්න.

**5.** $7\frac{1}{2}$ විෂම භාගයක් ලෙස දක්වන්න.

**6.** $y \times y \times y$ මෙය දර්ශක ආකාරයට දක්වන්න.

**7.** දී ඇති රූපයෙහි $\frac{3}{8}$ ක කොටසක් අඳුරු කරන්න.




**8.** $5x - 3x + 2x$ සුළු කරන්න.


**9.** බස්නාහිර හා උතුර අතර පිහිටි අනු දිශාව කුමක් ද?

**10.** $x - 3 = 2$ නම් $x$ හි අගය සොයන්න.

**11.** ඉරට්ට සංඛ්‍යාවක් වන ප්‍රථමක සංඛ්‍යාව කුමක් ද?

**12.** ප.ව. 12.35 සම්මත වෙලාවෙන් දක්වන්න.

**13.**  මෙම රූපය මගින් වාහන 4 ක් නිරූපණය කෙරේ නම්, පහත නිරූපිත වාහන ගණන කොපමණ ද?



**14.** 4 හා 6 යන සංඛ්‍යාවල කුඩා පොදු ගුණාකාරය සොයන්න.

**15.** ග්‍රෑම් 2030 , $kg$ හා $g$ වලින් දක්වන්න.

**16.** පාදයක දිග $6\ cm$ වූ සමචතුරස්‍රයක පරිමිතිය කොපමණ ද?

The National e-learning Portal for The General Education

| | |
|---|---|
| **17.** $\frac{1}{3}+\frac{1}{6}$ සුළු කරන්න. | **18.** $XXIX$ හින්දු අරාබි ඉලක්කමෙන් දක්වන්න. |
| **19.** $3^3$ හි අගය සොයන්න. | **20.** සුළු කෝණයක් ඇඳ එය $A\hat{B}C$ ලෙස නම් කරන්න. |

## II කොටස

ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න. ( එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලැබේ. )

**1.** I. 3056 යන සංඛ්‍යාව ස්ථානීය අගයන් දැක්වෙන සේ විහිදුවා ලියා ගණක රාමුවක නිරූපණය කරන්න.

II. $6827 + 586 - 79$ සුළු කරන්න.

III. $256 \times 25$ සුළු කරන්න.

IV. පොත් 72 ක් සිසුන් 6 දෙනෙකු අතරේ සමසේ බෙදු විට එක් අයෙකුට ලැබෙන පොත් ගණන කොපමණ ද?

**2.** I. පහත භාග ආරෝහණ පිළිවෙලට සකසා ලියන්න.

$(a).\ \frac{1}{2}, \frac{1}{5}, \frac{1}{3}$ $\qquad$ $(b).\ \frac{2}{3}, \frac{3}{4}, \frac{1}{2}$

II. $\frac{2}{3}$ ට තුල්‍ය භාග දෙකක් ලියන්න.

III. $\frac{3}{4}+\frac{1}{8}-\frac{1}{2}$ සුළු කරන්න.

IV. $3.85 - 1.7 + 0.83$ සුළු කරන්න.

**3.** I. බෝතලයක ඇති ජල පරිමාව ලීටර් 3.25 කි. එම පරිමාව මිලිලීටර්වලින් දක්වන්න.

II. $(a).$
$$\begin{array}{rr} 5\,l & 375\,ml \\ +\,3\,l & 825\,ml \\ \hline \\ \hline\hline \end{array}$$


$(b)$
$$\begin{array}{rr} 3\,l & 50\,ml \\ \times & 7 \\ \hline \\ \hline\hline \end{array}$$

III. $A$ නම් නගරයක සිට $B$ නගරයකට දුර $3\ km\ 455\ m$ ද $B$ නගරයේ සිට $C$ නගරයකට දුර $15\ km\ 785\ m$ ද වේ. $A$ හා $C$ නගර අතර මුළු දුර සොයන්න.

IV. $50\ kg$ ක සහල් මිටියකින් $37\ kg\ 250\ g$ ක් විකුණු පසු ඉතිරි සහල් ප්‍රමාණය සොයන්න.

**4.** I. පොතක මිල රුපියල් 35 ක් ද පෑනක මිල රුපියල් 12 ක් ද වේ. මෙම ද්‍රව්‍ය දෙකම මිලට ගෙන රුපියල් 50 නෝට්ටුවක් දුන් විට ලැබෙන ඉතිරි මුදල ගණනය කරන්න.

II. පැත්තක දිග $25\ cm$ වූ සමචතුරස්‍රාකාර පිගන් ගඩොල් 4 ක් තබා ඇති ආකාරය පහත රූපයේ දැක්වේ.




$(a)$. පිගන් ගඩොලක පරිමිතිය සෙන්ටිමීටර්වලින් සොයන්න.

$(b)$. පිගන් ගඩොල් 4 යොදා සාදා ඇති ඉහත හැඩයේ පරිමිතිය සෙන්ටිමීටර්වලින් සොයන්න.

$(c)$. එම පරිමිතිය මීටර්වලින් කොපමණ ද?

**5.** I. $5, 8, -3, 7, 1, 10, -7, 4, 6, 9, -1$ යන සංඛ්‍යා අතුරින් පහත එක් එක් සංඛ්‍යා වර්ගයට අයත් සංඛ්‍යා වෙන වෙන ම ලියන්න.


$(a)$. ඉරට්ට සංඛ්‍යා

$(b)$. ප්‍රථමක සංඛ්‍යා

$(c)$. ඍණ නිඛිල

II. $13, 40, 56, 75, 99$ යන සංඛ්‍යා, රෝම ඉලක්කමෙන් ලියා දක්වන්න.

III.




$(a)$. මෙහි ඇති සජාතීය පද වෙන වෙන ම එකතුවක් ලෙස දක්වන්න.

$(b)$. මෙහි සියලු පදවල එකතුව වීජීය ප්‍රකාශනයක් ලෙස දක්වන්න.

**6.** I. 卌 // මෙම ප්‍රගණන ලකුණු මගින් නිරූපිත අගය කීය ද?

II. එක්තරා පිරිවෙනක එක් එක් පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යා පහත වගුවේ දැක්වේ.


| පංතිය | 1 වසර | 2 වසර | 3 වසර | 4 වසර | 5 වසර |
|---|---|---|---|---|---|
| සිසුන් සංඛ්‍යාව | 3 | 6 | 9 | 5 | 2 |

$(a)$. එම පිරිවෙනෙහි සිටින මුළු සිසුන් ගණන කොපමණ ද?

$(b)$. ඉහත තොරතුරු තීර ප්‍රස්තාරයක දක්වන්න.

$(c)$. 5 වසරට වඩා 3 වසරෙහි සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද?

**7.** I. දී ඇති රූප සටහන ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.




| කෝණයේ නම | ශීර්ෂය | බාහු | කෝණ වර්ගය |
|---|---|---|---|
| $A\hat{D}C$ | | | |
| $B\hat{D}C$ | | | |

II. $(a)$. $x$ හා $y$ අක්ෂ ඒකක 5 බැගින් වූ බණ්ඩාංක තලයක් අඳින්න.


$(b)$. එහි පහත පටිපාටිගත යුගල ලකුණු කරන්න.

$A\,(1,1)\quad B\,(4,1)\quad C\,(4,3)\quad D\,(1,3)$

$(c)$. ඒවා $AB$ , $BC$ , $CD$ , $DA$ පිළිවෙලට යා කරන්න.

$(d)$. එවිට ලැබෙන තල රූපයේ නම කුමක් ද?

**8.** $(i)$. අදාළ ස්ථාන නිවරදි ව ස්ථාන ගත කර පිළිතුරු සපයන්න.




$(a)$. ආවාසයට උතුරින් චෛත්‍යය ද, දකුණින් විහාර ගෙය ද පිහිටා ඇත.

$(b)$. ආවාසයට නිරිත දෙසින් පිරිවෙන ද, පිරිවෙනට උතුරින් පුස්තකාලය හා බෝධිය ද පිහිටයි.

$(c)$. බෝධියට නැගෙනහිර දෙසින් චෛත්‍යය හා ධර්ම ශාලාව පිහිටන අතර ධර්ම ශාලාවට දකුණු දෙසින් දාන ශාලාව හා නා ගස පිහිටයි.

$(d)$. විහාරයට නැගෙනහිරින් නා ගස ඇත.

$(ii)$. $(a)$. ආවාසයට ඊසාන දෙසින් පිහිටන්නේ කුමක් ද?

$(b)$. නා ගසට වයඹ දෙසින් පිහිටන්නේ මොනවා ද?

***